(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **55.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 සැප්තැම්බර් 07 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

**ගරු අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

**ගරු මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

**ගරු ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

**ගරු නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

**ගරු මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු රොෂාන් රණසිංහ මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

**ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

**ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය

**ගරු විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

**ගරු කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

**ගරු ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනූප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

**ගරු කපිල අතුකෝරල මහතා**

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

**ගරු සම්පත් අතුකෝරල මහතා**

**ගරු තිස්ස අත්තනායක මහතා**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

**ගරු වජිර අබේවර්ධන මහතා**

**ගරු අශෝක් අබේසිංහ මහතා**

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

**ගරු මායාදුන්න චින්තක අමල් මහතා**

**ගරු ජේ. සී. අලවතුවල මහතා**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**

**ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

**ගරු එම්. උදයකුමාර් මහතා**

**ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

**ගරු සංජීව එදිරිමාන්න මහතා**

**ගරු අකිල එල්ලාවල මහතා**

**ගරු ලලිත් එල්ලාවල මහතා**

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**

**ගරු ෆයිසාල් කාසිම් මහතා**

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සූ. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VI, VIII, IX, X, XI, XII, XIII හා XIV කොටස්, සිව්වැනි කාණ්ඩයේ I හා II කොටස්, පස්වැනි කාණ්ඩයේ I, II හා III කොටස් සහ හයවැනි කාණ්ඩයේ II කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යෝජනා කරන ලදී.

(2) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් —

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අංශය, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2022 අංක 43 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2023.07.01 සිට 2023.07.31 දක්වා ජාතික අයවැය

දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලේඛන **සභා මේසය** මත තැබිය යුතු යැයි යෝජනා කරන ලදී.

(4) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු අනුප පැස්කුවල් මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2020 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) විවෘත හා වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2022 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) විවෘත හා වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2022 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

3. **පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක්

සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා සහ අ.භා. 1.00 සිට අ.භා. 7.30 දක්වා ද විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතාට එරෙහි විශ්වාස භංගත්වය:** විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2023 සැප්තැම්බර් 06) "අද වන විට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ උද්ගතව ඇති අර්බුදයට විසඳුම් මේ දක්වා ඉදිරිපත් කර නොමැති හෙයින්ද;

දිනෙන් දින රෝහල්වලින් වාර්තා වන කණගාටුදායක සිදුවීම් බොහොමයක් ප්‍රමිතියෙන් තොර හෝ බාල ඖෂධ භාවිතය හේතුවෙන් සිදුවන මරණ හා අනතුරු බව විද්වතුන්ගේ මතය වන හෙයින්ද;

ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පරිපූර්ණ ලෙස පත් නොකිරීම, බාල වර්ගයේ ඖෂධ ගෙන්වීම, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව ඖෂධ ගෙන්වීම, අධික මිලකට ඖෂධ ගෙන්වීම, රෝහල් පද්ධතිය තුළ අත්‍යවශ්‍ය ඖෂධවල හිඟකම, රසායනාගාර උපකරණවල හිඟය, ලියාපදිංචි නොවූ ඖෂධ හදිසි මිලදී ගැනීම් ලෙස මිලදී ගැනීම හා ඒවා භාවිතය නිසා සිදු වූ මරණ හා අනතුරු යන කාරණා වලදී සෞඛ්‍ය අමාත්‍යවරයා ලෙස එම තත්ත්වයන්ට වගකිව යුතු හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම ආරක්ෂා කිරීමට රජය බැඳී සිටින නමුත්, එම මූලධර්ම උල්ලංඝනය නොවන අයුරින් මෙරටට ඖෂධ ගෙන්වීමේ ක්‍රියාවලිය නිවැරදි ලෙස නියාමනය කිරීම සෞඛ්‍ය අමාත්‍යවරයා පැහැර හැර ඇති හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 53 ව්‍යවස්ථාව ප්‍රකාරව ලබා දී ඇති ප්‍රතිඥාව කඩකොට ජනතාව වෙනුවෙන් වූ සුරක්ෂිත සෞඛ්‍ය සේවය විනාශ කිරීමට සෞඛ්‍ය අමාත්‍යවරයා ක්‍රියාකර ඇති හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍යවරයා සිය මූලික යුතුකම් පැහැර හැර ඇති හෙයින් හා ඔහුගේ වගකීම් විරහිත ක්‍රියා කලාපය හේතුවෙන් ජනතාවට ජීවිතවලින් වන්දි ගෙවීමට සිදුව ඇති හෙයින්;

සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතාට තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා.29/2023]

(පූ.භා. 11.07ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.44ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.)

"ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.18ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 4.30 වූයෙන්, "දැන් විවාදය කල් තැබිය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එතැන් සිට විවාදය 2023 සැප්තැම්බර් 08 සිකුරාදා පවත්වනු ලැබේ.

**5. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත:** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. (ඊට අදාළ ප්‍රශ්නය 2023 සැප්තැම්බර් 06 )

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.06ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 6.51ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 102; විරුද්ධව 58; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය පනස් හයක් (156) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Pavithradevi Wanniarachchi | Yes |
| G 002. Nimal Siripala De Silva | Yes |
| G 005. Prasanna Ranatunga | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Douglas Devananda | Yes |
| G 010. Bandula Gunawardana | Yes |
| G 011. Keheliya Rambukwella | Yes |
| G 012. Mahinda Amaraweera | Yes |
| G 013. Wijeyadasa Rajapakshe | Yes |
| G 015. Ramesh Pathirana | Yes |
| G 016. M. U. M. Ali Sabry | Yes |
| G 017. Vidura Wickramanayaka | Yes |
| G 018. Kanchana Wijesekera | Yes |

| | |
|---|---|
| G 019. Naseer Ahamed | Yes |
| G 020. Manusha Nanayakkara | Yes |
| G 021. Ajith Rajapakse | Yes |
| G 022. Tiran Alles | Yes |
| G 023. Nalin Fernando | Yes |
| G 024. Roshan Ranasinghe | Yes |
| G 025. Jeewan Thondaman | Yes |
| G 026. Jagath Pushpakumara | Yes |
| G 027. Ranjith Siyambalapitiya | Yes |
| G 029. Mohan Priyadarshana De Silva | Yes |
| G 030. Janaka Wakkumbura | Yes |
| G 031. Shehan Semasinghe | Yes |
| G 032. Kanaka Herath | Yes |
| G 033. Thenuka Vidanagamage | Yes |
| G 034. Pramitha Bandara Tennakoon | Yes |
| G 035. Lasantha Alagiyawanna | Yes |
| G 036. Rohana Dissanayaka | Yes |
| G 038. Arundika Fernando | Yes |
| G 039. Vijitha Berugoda | Yes |
| G 042. Tharaka Balasuriya | Yes |
| G 043. Indika Anuruddha Herath | Yes |
| G 044. Siripala Gamalath | Yes |
| G 045. Anuradha Jayaratne | Yes |
| G 047. D.V. Chanaka | Yes |
| G 048. Sisira Jayakody | Yes |
| G 049. Piyal Nishantha De Silva | Yes |
| G 050. Prasanna Ranaweera | Yes |
| G 051. D. B. Herath | Yes |
| G 052. Shasheendra Rajapaksa | Yes |
| G 053. Seetha Arambepola | Yes |
| G 054. Shantha Bandara | Yes |
| G 055. K. Kadder Masthan | Yes |
| G 056. Asoka Priyantha | Yes |
| G 057. A. Aravindh Kumar | Yes |

| | |
|---|---|
| G 059. Suren Raghavan | Yes |
| G 060. Diana Gamage | Yes |
| G 061. Sivanesathurai Santhirakanthan | Yes |
| G 062. Chamara Sampath Dasanayake | Yes |
| G 063. Anupa Pasqual | Yes |
| G 066. Gamini Lokuge | Yes |
| G 067. Vajira Abeywardena | Yes |
| G 069. C. B. Rathnayake | Yes |
| G 070. S. M. Chandrasena | Yes |
| G 071. Mahindananda Aluthgamage | Yes |
| G 072. Rohitha Abeygunawardana | Yes |
| G 075. Wimalaweera Dissanayaka | Yes |
| G 077. Kapila Athukorala | Yes |
| G 078. Gayashan Nawananda | Yes |
| G 079. S. M. M. Muszhaaraff | Yes |
| G 080. Jayantha Ketagoda | Yes |
| G 081. Sampath Athukorala | Yes |
| G 083. U. K. Sumith Udukumbura | Yes |
| G 084. Pradeep Undugoda | Yes |
| G 085. Sanjeeva Edirimanna | Yes |
| G 086. Akila Ellawala | Yes |
| G 088. Karunadasa Kodithuwakku | Yes |
| G 089. Nalaka Bandara Kottegoda | Yes |
| G 090. Udayakantha Gunathilaka | Yes |
| G 091. Kokila Gunawardene | Yes |
| G 092. Milan Jayathilake | Yes |
| G 093. Kulasingam Dhileeban | Yes |
| G 094. Sudarshana Denipitiya | Yes |
| G 095. Isuru Dodangoda | Yes |
| G 096. Premanath C. Dolawatte | Yes |
| G 097. H. Nandasena | Yes |
| G 098. Muditha Prishanthi | Yes |
| G 099. Sudath Manjula | Yes |
| G 100. Mayadunna Chinthaka Amal | Yes |

| | |
|---|---|
| G 102. Kumarasiri Rathnayaka | Yes |
| G 103. Gunathilaka Rajapaksha | Yes |
| G 104. Upul Mahendra Rajapaksha | Yes |
| G 106. Rajika Wickramasinghe | Yes |
| G 107. M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 108. Madhura Withanage | Yes |
| G 109. D. Weerasingha | Yes |
| G 110. Samanpriya Herath | Yes |
| G 111. Sagara Kariyawasam | Yes |
| G 112. Yadamini Gunawardena | Yes |
| G 113. Manjula Dissanayake | Yes |
| G 114. Ranjith Bandara | Yes |
| G 115. Jayantha Weerasinghe | Yes |
| O 003. Imthiaz Bakeer Markar | No |
| O 004. Tissa Attanayake | No |
| O 006. Gayantha Karunatilleka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 012. Mano Ganesan | No |
| O 015. G.L. Peiris | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. A. L. M. Athaullah | Yes |
| O 020. Athuraliye Rathana Thero | No |
| O 022. Kabir Hashim | No |
| O 024. Abdul Haleem | No |
| O 026. Harsha De Silva | No |
| O 028. R. M. Ranjith Madduma Bandara | No |
| O 029. Dilip Wedaarachchi | No |
| O 031. Eran Wickramaratne | No |
| O 032. J. C. Alawathuwala | No |
| O 037. Vijitha Herath | No |
| O 040. Ali Sabri Raheem | Yes |
| O 043. Faizal Cassim | No |
| O 044. Ashok Abeysinghe | No |

| | |
|---|---|
| O 046. Ajith Mannapperuma | No |
| O 047. Buddhika Pathirana | No |
| O 048. M. S. Thowfeek | No |
| O 049. Nalin Bandara Jayamaha | No |
| O 050. Hector Appuhamy | No |
| O 051. Thushara Indunil Amarasena | No |
| O 052. Velu Kumar | No |
| O 053. Dilan Perera | No |
| O 054. Wimal Weerawansa | No |
| O 056. Vasudeva Nanayakkara | No |
| O 057. Harini Amarasuriya | No |
| O 061. Kavinda Heshan Jayawardhana | No |
| O 063. K. Sujith Sanjaya Perera | No |
| O 064. S. M. Marikkar | No |
| O 065. Imran Maharoof | No |
| O 067. Harshana Rajakaruna | No |
| O 071. M. Udayakumar | No |
| O 072. Hesha Withanage | No |
| O 075. Chandima Weerakkody | No |
| O 076. Dayasiri Jayasekara | No |
| O 080. S. Rajaputhiran Rasamanickam | No |
| O 081. W. H. M. Dharmasena | No |
| O 082. Kins Nelson | No |
| O 083. Rohana Bandara | No |
| O 085. Udaya Gammanpila | No |
| O 086. Nalaka Godahewa | No |
| O 089. Nimal Lanza | Yes |
| O 090. Jayantha Samaraweera | No |
| O 094. Lalith Ellawala | No |
| O 095. Udayana Kirindigoda | No |
| O 096. K. P. S. Kumarasiri | No |
| O 097. Upul Galappaththi | No |
| O 099. Asanka Navarathna | No |
| O 101. Lalith Varna Kumara | Yes |

| | |
|---|---|
| O 102. S. Jagath Samarawickrama | Yes |
| O 107. Wasantha Yapabandara | No |
| O 109. Gamini Waleboda | No |
| O 110. Weerasumana Weerasinghe | No |
| O 111. Gevindu Cumaratunga | No |
| O 112. Charitha Herath | No |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඈ) අනුකූලව මහ ලේකම් විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හතර දෙනෙකුගෙන් (04) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| A. H. M. Fowzie | Yes |
| V. Radhakrishnan | Yes |
| S. Viyalanderan | Yes |
| Sarath Fonseka | No |

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

“පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතු ය”යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**6. සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත:** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. (ඊට අදාළ ප්‍රශ්නය 2023 සැප්තැම්බර් 06 )

“පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය”යි යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

“පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය”යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

“ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

“පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතු ය”යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**7. කල් තැබීම**: “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය”යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එකල්හි වේලාව අ.භා. 7.17 වූයෙන්, කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව, 2023 සැප්තැම්බර් 08 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.